# දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු - අධ්‍යක්ෂ තනතුර

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM) කළමනාකරණය කිරීම සහ නායකත්වය සැපයීම සඳහා සුදුසුකම්ලත් පළපුරුදු ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

PGIIM අධ්‍යක්ෂ ආයතනයේ පූර්ණ කාලීන නිලධාරියකු වන අතර ප්‍රධාන විධායක, අධ්‍යයන හා ගිණුම්කරණ නිලධාරියා ද වේ. ඔහු / ඇය ආයතනය තුළ විනය පවත්වාගෙනයාම පිළිබඳව වගකිව යුතුය. ඔහු / ඇය නිල බලයෙන් කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු සහ සභාපති ද වේ.

**1. සුදුසුකම් :**

වෛද්‍ය විශාරද උපාධිය (MD) හෝ වෛද්‍ය හෝ දේශීය වෛද්‍ය ආචාර්ය උපාධියක් (PhD හෝ සමාන) ලබා තිබිය යුතුය.

- ආචාර්ය සුදුසුකම් ලබා ගැනීමෙන් පසු වසර පහක (05) පරිපාලනමය පළපුරුද්ද ලබා තිබිය යුතුය.
- විශේෂයෙන් දේශීය වෛද්‍ය හෝ බටහිර (ඇලෝපති) වෛද්‍ය උසස් අධ්‍යාපනය පිළිබඳ පෙර පරිපාලනමය පළපුරුද්ද අමතර වාසියක් වනු ඇත.

**2. වයස :**

අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන් වයස අවුරුදු 63 ට අඩුවිය යුතුය.

**3. වැටුප් පරිමාණය :**

රු. 117,350 - 13X2700 - 152,450 මසකට U AC 5(11) සහ තනතුරට අදාළ දීමනා.

අයදුම්කරු විශ්වවිද්‍යාල පනතේ නිර්නය කොට ඇති පරිදි, ඉහත වැටුපට වඩා වැඩි වැටුපක් ලබන ආචාර්යවරයෙක් නම් ඔහු / ඇය දැනට ලබන වැටුප් තලයෙහිම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ පරිදි අධ්‍යයන දීමනාව හා අනෙකුත් දීමනා සමග පිහිටුවනු ඇත.

සැ.යු: දැනටමත් රාජ්‍ය සේවයේ නිරතව ඉහත වැටුප් පරිමානයේ මූලික වැටුප ඉක්මවා වැටුප් ලබන අය සමාන වැටුප් තලයක පිහිටුවනු ඇත.

පත්වීමේ කොන්දේසි හා නියමයන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ (සංශෝධිත පරිදි) සහ 2017 අංක 05 දරන දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන ආඥා පනතේ විධිවිධාන මගින් ආවරණය වනු ඇත.

**4. ධූර කාලය**

පත්වීම ලැබූ දින සිට වසර තුනක් හෝ 65 වන උපන් දිනය තෙක්. (පළමුව එළැඹෙන දිනය අනුව)

**5. වෙනත් වරප්‍රසාද**

i. නිල ප්‍රවාහනය

ii. සංග්‍රහ දීමනාව

iii. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ දායකත්වය

iv. සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලේ දායකත්වය.

**6. අයදුම්පත් ඉදිරිපත් කිරීම**

අපේක්ෂිත අයදුම්කරුවන් තම ජීව දත්ත සහිත අයදුම්පත් 2020 නොවැම්බර් මස 10 වන දින හෝ ඊට පෙර, බොරැල්ල, කොටා පාරේ, ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහලේ, 5 වන මහල කොළඹ / විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ **"අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත"** යනුවෙන් සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ තනතුරට පත් කරනු ලැබුවහොත් ආයතනයේ සංවර්ධනය සඳහා වන ඔහුගේ / ඇයගේ දැක්ම හා සපුරා ගැනීමට බලාපොරොත්තු වන ඉලක්කයන් පිළිබඳ ප්‍රකාශයක් සහ අයදුම්කරුගේ උපන් දිනය ඇතුළු සම්පූර්ණ ජීව දත්ත සඳහන් අයදුම්පතක් 2020 සැප්තැම්බර් 11 නිකුත් කළ අංක 2020/07 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයෙහි දක්වා ඇති ඇගයීම් ප්‍රභේදයන්ට අනුව සාක්ෂි සමග ඉදිරිපත් කළ යුතු වේ.

විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපිත කළ විශ්වවිද්‍යාල හා ආයතනවල, රාජ්‍ය සේවයේ, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතනවල ප්‍රධානීන් මගින් එවිය යුතුය.

අසම්පූර්ණ හෝ අපැහැදිලි හෝ ඉහත සඳහන් අවශ්‍යතාවලට අනුකූල නොවන හෝ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් කලින් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,**
**කළමනාකරණ මණ්ඩලයේ ලේකම්,**
**දේශීය විද්‍යා වෛද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**කොළඹ විශ්වවිද්‍යාලය,**
**5 වන මහල,**
**ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල,**
**කොටා පාර, බොරැල්ල.**

**2020 ඔක්තෝබර් 16**